**නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

# නාගරික සංවර්ධන අධිකාරිය

**නාගරික සංවර්ධන අධිකාරියේ 2021-2025 උපායමාර්ගික සැළැස්ම ජාතියේ යහපැවැත්ම සඳහා ප්‍රවේශම් සහගත සැළසුම් ක්‍රියාත්මක කිරීම සහ තිරසර නාගරික සංවර්ධනය තුළින් සැළසුම්සහගත, තිරසර හා ජනතා කැමැත්ත හිමිවන නාගරීකරණයක් කරා ජාතිය යොමු කිරීමට අපේක්ෂා කරයි. සැළැස්මෙහි උපායමාර්ගික ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කරගනු වස් ප්‍රමාණවත් මිනිස්බලය සහ අනෙකුත් සම්පත් නාගරික සංවර්ධන අධිකාරිය සතුවීම ඉතා වැදගත් වේ. උපායමාර්ගික ඉලක්ක ළඟාකර ගැනීමෙහිලා සම්පත් උපරිමයෙන් භාවිතා කිරීම මූලික බලපෑමක් සිදුකරන්නේ යැයි සැළකෙන හෙයින් උපායමාර්ගික මෙහෙයුම් කටයුතු විධිමත් කිරීමට උද්‍යෝගී කුසලතා සතු සේවකයන්ගේ විශේෂඥ දැනුම උකහා ගැනීමට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.**

# පුරප්පාඩු

## ජ්‍යෙෂ්ඨ උපදේශක (නීති) - කොන්ත්‍රාත් පදනම

ඉහත තනතුරෙහි පුරප්පාඩුව සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් සතුව පහත සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද තිබිය යුතුය.

★ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් පිළිගනු ලබන පිළිගත් විශ්වවිද්‍යාලයක් වෙතින් ලබාගත් නීතිය පිළිබඳ ප්‍රථම (විශේෂ) උපාධිය

සහ

★ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගනු ලබන පිළිගත් විශ්වවිද්‍යාලයන් වෙතින් ලබාගත් පශ්චාත් උපාධි (Masters) සුදුසුකම්

සහ

★ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්

සහ

★ නීතිඥ සංගමයේ සාමාජිකත්වය

සහ

පිළිගත් ආයතනයක ජ්‍යෙෂ්ඨ නීති නිලධාරි / ජ්‍යෙෂ්ඨ නීති උපදේශක ලෙස වසර 20 ක උපාධි ලැබීමෙන් පසු පළපුරුද්ද සහ ගිවිසුම් නීතිය, කම්කරු නීතිය, වත්කම් ප්‍රසම්පාදනය, නෛතික ලිපිලේඛන කෙටුම්පත් කිරීම ටෙන්ඩර් හා ගිවිසුම් ලිපිලේඛන, ඉඩම් සහ ඉඩම් පිළිබඳ කටයුතු ආදියෙහි පළපුරුද්ද සහ සිවිල් අධිකරණයක නීතිඥවරයෙකු ලෙස වෘත්තියෙහි නිරතවී මෙයින් වසර 10 ක් රජයේ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක ජ්‍යෙෂ්ඨ නීති නිලධාරි / ජ්‍යෙෂ්ඨ නීති උපදේශක ලෙස විය යුතුය.

**★ අයදුම්කරුවන් වසර අවු. 60 ට අඩු විය යුතුය.**

**වැටුප : සාකච්ඡා කළ හැකිය.**

**රියදුරු සමග නිල වාහනයක් ලබාදෙනු ඇත.**

අදාළ සියලු සහතිකවල පිටපත් සමග සම්පූර්ණ ජීව දත්ත 2021 පෙබරවාරි 10 වෙනි දින හෝ ඊට පෙර බත්තරමුල්ල "සෙත්සිරිපාය" 9 වන මහලේ, නාගරික සංවර්ධන අධිකාරියේ, සභාපති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. අදාළ සහතික අමුණා එවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**නාගරික සංවර්ධන අධිකාරිය,**
**9 වන මහල, "සෙත්සිරිපාය",**
**බත්තරමුල්ල.**